සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 8 | විෂයය / பாடம் / Subject: නර්තනය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ......................................................................................... විභාග අංකය :- ...........................

**සැලකිය යුතුයි:**

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව II උඩරට නර්තනය III පහතරට නර්තනය IV සබරගමු නර්තනය යන කොටස්වලින් ඔබ හදාරණ කොටස තෝරාගෙන ප්‍රශ්න 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

## I කොටස

- **හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර තෝරන්න.**

(01) නර්තනයේ මාධ්‍යය ............................................ යි.
(1) රේඛා (2) චලනය
(3) නාදය (4) ගීතය

(02) හස්ත හා පාද චලන හුරු කර ගැනීමට ......................................... උපකාරී වේ.
(1) සරඹ පද (2) පා සරඹ
(3) දණ්ඩියමේ සරඹ (4) මණ්ඩි පද

(03) 'ලොව බැති කරවන පත්තිනි සඳින්නේ' මෙය .......................................... නැටුමට අයත් කවි පාදයකි.
(1) තෙල්මෙ (2) චාමර (3) පතුරු (4) කුළු

(04) නර්තනයේ දී යෙදෙන ලය කොටස් .......................................... කි.
(1) දෙක (2) තුන (3) හතර (4) හය

(05) කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ..........................................  ගරු කිරීමට හුරුවේ.
(1) නායකත්වයට (2) මිතුරාට
(3) දෙමව්පියන්ට (4) ගුරුවරයාට

- **අංක 06 සිට 10 දක්වා වූ ප්‍රශ්නවලට අදාළ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(06) 'තත් තකට තක රොං.................... , ....................... කුද තකරොං'
මෙහි හිස්තැනට ගැලපෙන පද වන්නේ,
(1) දොමිත, දොමිත (2) රුංතක, ජිංතක
(3) රුංතක, කඩතක (4) තක්කඩ, තක්කඩ

Department of Education – Western Province

(07) මින් සතර බීජාක්ෂර වන්නේ,

(1) දොමිකිට කිට දොං (2) තත් ජිත් තොං නං

(3) කුද ගත ගත දොං (4) තකු තක ජිජි කුද

(08) නර්තන කලාව හා බැඳි ලී කැටයම් දැකිය හැකි ස්ථානයකි.

(1) අනුරාධපුරයේ කුට්ටම් පොකුණ

(2) පොළොන්නරුවේ එල්ලෙන පහන

(3) ඇම්බැක්කේ දේවාලය

(4) මහනුවර දළදා මාළිගාව

(09) භරත නාට්‍යම් ප්‍රචලිත ප්‍රදේශයකි.

(1) දිල්ලි ය. (2) ලක්නව් (3) කේරල ය. (4) තාංජෝරය

(10) 

මෙම රූපයෙහි දැක්වෙන්නේ පහතරට නර්තන කලාවේ ප්‍රවර්ධනයට දායක වූ

(1) එස්. පනීභාරත මහතා ය.

(2) කේ. එස්. ප්‍රනාන්දු මහතා ය.

(3) ජී. වී. හීන්නිලමේ මහතා ය.

(4) ජේ. ඊ. සේදරමන් මහතා ය.

- **පහත සඳහන් කියමන් හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

(11) 'රත්න දීප ජන්ම භූමි' ගීතය රචනා කරන ලද්දේ මහගම සේකරයන් විසිනි. ( )

(12) කනත්තක් අසලින් යනවිට පන්දම නිවීම, සුදු ඇඳගත් රුවක් දැකීම යනාදී සිද්ධි නිරූපණයේ දී 'භය' නැමති ස්ථායි භාවය ඉස්මතු වේ. ( )

(13) සිසු ආකල්ප සංවර්ධනය කිරීමට නමස්කාර පදය උපයෝගී නොවේ. ( )

(14) වන්නම් ප්‍රථමයෙන් ම ගායනා කරන ලද්දේ මහනුවර කවිකාර මඩුවේ දී ය. ( )

(15) ගොප් ගෙඩිය අවමංගල උත්සව සඳහා භාවිතා කරයි. ( )

## <u>II උඩරට නර්තන සම්ප්‍රදාය</u>

(16) තෙයියත් /// තාම් තේයි......... පා සරඹ පදයෙහි ඉතිරි පද කොටස වන්නේ,

(1) තාම් තෙයි තෙයි (2) තත්තක තෙයියත් තාම්

(3) තත්තක තෙයි තෙයි (4) තෙයියත් තත්තක තෙයි තාම්

(17) මාත්‍රා 2 + 3 තාල රූපයට අයත් කස්තිරමක කොටසකි.

(1) කුද ගජිගත/// කුද තා (2) කුද ගජිත කුද ගජිගත

(3) කුද ගජිත /// කුද තා (4) කුද තකට තක රොං

(18) ''පාතල ......................... වන්නම මේවා'' මෙම කවි පදයේ හිස්තැනට සුදුසු වචනය වන්නේ,

(1) නෛඅඩි (2) මුසලඩි (3) බලවැඩි (4) වෛරොඩි

Department of Education – Western Province

(19) දෙවොල් මඩු ශාන්ති කර්මයේ දී ප්‍රධාන වශයෙන් පුද ලබන දෙවි කෙනෙකි.

(1) දෙවොල් දෙවියන් (2) කොහොඹා දෙවියන්

(3) දැඩිමුණ්ඩ දෙවියන් (4) කුරුම්බර දෙවියන්

(20) පහතරට බෙරය වාදනය කරනු ලබන අවස්ථාවකි.

(1) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ (2) දෙවොල් මඩු ශාන්ති කර්මයේ

(3) පහන් මඩු ශාන්ති කර්මයේ (4) බලි ශාන්ති කර්මයේ

(ලකුණු 20)

## III පහතරට නර්තන සම්ප්‍රදාය

(16) තෙයියත් තා කිට ............ පා සරඹ පදයෙහි ඉතිරි පද කොටස වන්නේ.

(1) දොම් තෙයියත් ගත (2) තෙයියත් ගහිති ගතම්

(3) තෙයියත් දිරිකිට (4) තෙයියත් තරිකිට

(17) මාත්‍රා 2 + 3 තාල රූපයට අයත් ඉරට්ටියක කොටසකි.

(1) දොංත ගත්තං ගදිත ගත්තං..... (2) ගුද ගදිගත ගුද ගුද ගදිගත

(3) දිං ගදි ගතම් දොම්ත (4) දොංත ගත් දෙගත ගත.....

(18) ''කිපී ලොව දිලෙන තද තෙදැති..... ගේ.....'' මෙම කවි පදයෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ,

(1) සරණ (2) නිකල (3) තඹර (4) දිනිඳු

(19) පහන් මඩු ශාන්ති කර්මයේ දී ප්‍රධාන වශයෙන් පුද ලබන දෙවි කෙනෙකි.

(1) පත්තිනි දෙවියන් (2) කොහොඹා දෙවියන්

(3) දැඩිමුණ්ඩ දෙවියන් (4) කුරුම්බර දෙවියන්

(20) ගිරිදේවි නැටුම සකස් කිරීමේ ගෞරවය ලබන්නේ,

(1) එස් පණීභාරත මහතා (2) ජී. වී. හීන්නිලමේ මහතා

(3) කේ. එස්. ප්‍රනාන්දු මහතා (4) චිත්‍රසේන මහතා

(ලකුණු 20)

## IV සබරගමු නර්තන සම්ප්‍රදාය

(16) තෙයි දොම්....... මණ්ඩි පදයෙහි ඉතිරි පද කොටස වන්නේ,

(1) තෙයි ගත කුද (2) තෙයියත් දොම් - තෙයියත් දොං

(3) තාතෙයි තා තෙයි (4) තා තරිකිට තා තෙයි

(17) මාත්‍රා 2 + 3 තාල රූපයට අයත් කලාසමක කොටසකි.

(1) කුදිත ගදිත ගත ගදිගත (2) තත් තරිගු තත් තකට

(3) ජිං ගතත් ජෙං තා//// (4) ජෙජ් ජේං කුදත් තකට

(18) ............................... පක්ෂි වන්නමේ රඟ මෙහෙමා.... කවි පදයෙහි හිස්තැනට සුදුසු වචනය වන්නේ,

(1) කොවුලා (2) සැවුලා (3) විරාඩි (4) කදම්භ

Department of Education - Western Province

(19) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ දී ප්‍රධාන වශයෙන් පුද ලබන දෙවි කෙනෙකි.

(1) කොහොඹා දෙවියන් (2) දෙවොල් දෙවියන්

(3) පත්තිනි දෙවියන් (4) කුරුම්බර දෙවියන්

(20) සන්නි යකුම ශාන්ති කර්මය නොනැසී පවත්වා ගැනීම සඳහා කටයුතු කිරීමේ ගෞරවය ලබන්නේ,

(1) කේ. එස්. ප්‍රනාන්දු මහතා (2) එස්. පණීභාරත මහතා

(3) ජී.වී. හීන්නිලමේ මහතා (4) චිත්‍රසේන මහතා

(ලකුණු 20)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

(01) විවිධ කලාංගවල සුවිශේෂ ලක්ෂණ විචාරයට ලක්කිරීම තුළින් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(1) දළදා පෙරහැර පිළිබඳව ඓතිහාසික තොරතුරු 2ක් ලියන්න.

(2) දළදා පෙරහැර සම්බන්ධ චාරිත්‍ර 2ක් ලියන්න.

(3) දළදා පෙරහැරේ දක්නට ලැබෙන නර්තන අංග 2ක් ලියන්න.

(4) එහි දැකිය හැකි වාදන විශේෂාංගයක් ලියන්න.

(5) පෙරහැර අලංකාර කිරීම සඳහා දළදා පෙරහැරෙහි දැකිය හැකි වෙනත් විශේෂාංග 2ක් ලියන්න. (ලකුණු 2 × 5 = 10)

(02) (1) මාත්‍රා 2 + 3 දෙතිතට අයත් බෙරපදයක් / දවුල් පදයක් ලියන්න. (ලකුණු 02)

(2) මාත්‍රා 2 + 4 දෙතිතට අයත් කවියක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(3) මාත්‍රා 3 + 3 තනි තිතට අයත් කස්තිරම / ඉරට්ටිය / කලාසම ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

(03) ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය හැර වෙනත් නර්තන සම්ප්‍රදායන්ට අයත් ශාන්ති කර්ම හඳුනාගැනීම ඇසුරෙන්

(1) ඔබ ඉගෙන ගත් වෙනත් නර්තන සම්ප්‍රදායකට අයත් ශාන්ති කර්මයක් නම් කර පැවැත්වීමේ හේතු 2ක් ලියන්න. (ලකුණු 03)

(2) එම ශාන්ති කර්මයෙහි ප්‍රධාන රංග වස්ත්‍රාභරණ කට්ටලය නම් කර නර්තන අංග 2ක් ලියන්න. (ලකුණු 03)

(3) ශාන්ති කර්ම පැවැත්වීමේ දී සාමූහිකත්වයෙන් කටයුතු කිරීම පිළිබඳව කරුණු 2ක් ලියන්න. (ලකුණු 04)

(04) (1) නව රාත්‍රී උත්සවය පැවැත්වීමේ හේතු 2ක් ලියන්න. (ලකුණු 02)

(2) එහි පුද ලබන දෙවිවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 04)

(3) නව රාත්‍රී උත්සවයේ සැරසිලි පිළිබඳව විස්තරයක් ලියන්න. (ලකුණු 04)

Department of Education - Western Province